# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 | S | I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two Hours

විභාග අංකය.........................................

**උපදෙස් :**

*මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් හා **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 01 - 02 | |
| 2 | 03 - 08 | |
| 3 | 09 - 15 | |
| 4 | 16 - 21 | |
| 5 | 22 - 25 | |
| 6 | 26 - 30 | |
| 7 | 31 - 41 | |
| 8 | 42 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

### A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලනය,
(1) බලය සහ ආධිපත්‍ය සම්බන්ද ක්‍රියාවලියක් පමණි.
(2) නීත්‍යානුකූල ක්‍රියාමාර්ග මඟින් පමණක් සිදු කරයි.
(3) දේශය පාලනය කිරීම පමණි.
(4) දේශපාලන ක්‍රියාවලි සහ ක්‍රියාකාරකම් හඳාරන ක්ෂේත්‍රයයි.
(5) රාජ්‍යයට මෙන් ම මහජනතාවට ද අදාළ ක්‍රියාවලියකි. (......)

02. ආණ්ඩුව,
(1) රාජ්‍ය හා සමපාත වේ.
(2) දීර්ඝ කාලයක් ස්ථාවරව පවතී.
(3) රාජ්‍ය වෙනුවෙන් ක්‍රියාත්මක වේ.
(4) සෑම රාජ්‍යයකම එකම ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ.
(5) මූලික නෛතික ව්‍යුහයක් නොපවතී.
(......)

03. ගෝලීයකරණය,
(1) භෞමිකත්වය ඉතා වැදගත් කොට සලකයි.
(2) ගෝලීය ප්‍රාග්ධනය රාජ්‍ය ග්‍රහණයෙන් තවමත් මිදී නැත.
(3) ශ්‍රමිකයින්ගේ සංචලනය එතරම් වැදගත් සාධකයක් නොවේ.
(4) නව ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණවලින් පහසුකම් ලැබූ ක්‍රියාවලියකි.
(5) **'ජාතිය'** යන අදහසෙහි වැදගත්කම වැඩිකර ඇත. (......)

04. සමාජවාදී රාජ්‍ය මාදිළිය,
(1) පුරවැසියාගේ භෞතික ජීවන තත්ත්වය වර්ධනය නොකරයි.
(2) 18 වන සියවසේ අගභාගයේ දී වර්ධනය විය.
(3) දේශපාලන පක්ෂ ප්‍රවර්ධනයට ඉඩ ලබාදෙයි.
(4) තවදුරටත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ට විකල්පයකි.
(5) රුසියාව, චීනය ආදී රාජ්‍යවල අත්හදා බැලිණි. (......)

05. පාලන තන්ත්‍රය ,
(1) ආණ්ඩුව යන්නට සමාන වේ.
(2) මතවාද, සමාජ පදනම් හා නායකත්වය මත ගොඩනැගේ.
(3) ආණ්ඩුවේ සංයුතිය මත අධිකාරවාදී පාලන තන්ත්‍ර ගොඩනැගේ.
(4) මතවාද අනුව සභාග ආණ්ඩු ගොඩනැගේ.
(5) ආණ්ඩුවේ නායකත්වය අනුව සමාජවාදී පාලන තන්ත්‍ර ගොඩනැගේ. (......)

06. ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් වන්නේ,
(1) ස්වාධිපත්‍ය බලය තනි ජාතික ආයතනයකට පවරා තිබීම.
(2) ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වීම.
(3) ස්වාධිපත්‍ය බලය පළාත් පාලන ආයතන සමඟ බෙදා ගැනීම.
(4) මධ්‍යම ආණ්ඩුවට පහළ මට්ටමේ ආයතන අහෝසි කළ නොහැකි වීම.
(5) ෆෙඩරල් පාලන ක්‍රමයට සාපේක්ෂව සංකීර්ණ ක්‍රමයක් වීම. (......)

07. තුළනාත්මක ප්‍රවේශයේ වර්ධනය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
(1) සිඩ්නි වර්බා මෙහි පුරෝගාමියා වීම.
(2) අධිරාජ්‍යවාදී රටවල දේශපාලන ආකෘතිය යටත් විජිතවලට හඳුන්වාදීම.
(3) දෙවන ලෝක යුද්ධයෙන් පසු නව රාජ්‍යයන් බිහිවීම.
(4) ලෝකයේ ද්වී ධ්‍රැවීය බල තුළනය
(5) ඌණ සංවර්ධිත හා සංවර්ධිත ලෙස රාජ්‍යයන් බෙදීමකට ලක් වීම. (......)

08. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට අදාළ වන්නේ,
(1) අනිවාර්ය කම්කරු පංති විප්ලවය සිදුවිය යුතු බව දක්වයි.
(2) සමාජ සුබසාධනය පිළිනොගනී.
(3) ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මෙහිලා පුරෝගාමී විය.
(4) ධනවාදය මුළුමනින්ම පිළිගනී.
(5) ආර්ථික ක්ෂේත්‍රයට රාජ්‍ය මැදිහත් නොවිය යුතු බව දක්වයි. (......)

09. ගැටුම් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
(1) ගැටුම් මගින් නිශේධනීය ප්‍රතිඵල පමණක් උදාකරයි.
(2) සමනය කළ නොහැකි අරමුණු හා අභිලාෂ මත නිර්මාණය වේ.
(3) ගැටුම්වල ජීවන චක්‍රය ලුවිස් කෝසර් විසින් ඉදිරිපත් කර ඇත.
(4) ගැටුම්, පුද්ගලයන් හා සමාජය වෙනස් නොකරයි.
(5) ගැටුම් සමථනය කෙටි හා සරළ ක්‍රියාවලියකි. (......)

10. මානව අයිතිවාසිකම්,
(1) රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කර ඇත.
(2) රාජ්‍ය විසින් පිරිනමනු ලබයි.
(3) නිර්මාණය කරගන්නා ලද දෙයකි.
(4) පදනම් වන්නේ මනුෂ්‍යත්වය මතයි.
(5) කාලය සහ ප්‍රදේශය මත වෙනස් වේ. (......)

11. සීමිත ආණ්ඩුව,
(1) ලොක් සහ මොන්ටෙස්ක්‍යු විසින් මෙම සංකල්පයට විරුද්ධව අදහස් දක්වා ඇත.
(2) හොබ්ස් සහ මැකියාවෙලි විසින් මෙම අදහස පෝෂණය කර ඇත.
(3) මෙහිදී ආණ්ඩුවේ දේශපාලන බලය පමණක් සීමාවට ලක් කෙරේ.
(4) පුද්ගල නිදහස ආරක්ෂා නොකරයි.
(5) පරම බලවාදයට විරුද්ධව ඉදිරිපත් විය. (......)

12. ස්විට්සර්ලන්තය තුළ,
(1) නොදියුණු ෆෙඩරල් ක්‍රමයක් වන සහසන්ධීය ක්‍රමය ක්‍රියාත්මක වේ.
(2) කැන්ටන 29 ක් හා කොමියුන 2600 ක් දක්නට ලැබේ.
(3) සෑම විටම කැන්ටන අභිභවා යාමේ බලයක් මධ්‍යම ආණ්ඩුවට ඇත.
(4) හවුල් පාලනය හා ස්වයං පාලනය ප්‍රධාන ව්‍යවස්ථානුකූල සිද්ධාන්ත වේ.
(5) කැන්ටන්වලට ස්වාධීන පැවැත්මක් නැත. (......)

13. ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ,
(1) දේශපාලන බලය විමධ්‍යගත කොට ඇත.
(2) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට පවත්වාගෙන යාමේ භාරකාරත්වය ජනාධිපතිවරයාට හිමි වේ.
(3) පරිපාලන බලය විමධ්‍යගත කරණයේ දී ප්‍රාදේශීය ඒකකවලට දේශපාලන ස්වාධීනතාවය හිමි වේ.
(4) ජනාධිපති විසින් අමාත්‍යවරු ව්‍යවස්ථාදායකය තුළින් ම තෝරා පත්කරයි.
(5) ජාතික මන්ත්‍රණ සභාවේ කැමැත්ත මත පමණක් ජනාධිපති විසින් අගමැති පත්කරයි. (......)

14. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේ,
(1) සෑම අදියරයකදී ම සමකාලීන සිවිල් සංවිධානවල ක්‍රියාකාරීත්වය වැදගත් වේ.
(2) ව්‍යවස්ථාදායකය සතු බලය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී.
(3) විධායකයේ කාර්යභාරය ඉතා සීමිත වේ.
(4) සවිස්තර ක්‍රියාමාර්ග නිගමනය කිරීම සැබැවටම සිදුකරන්නේ ව්‍යවස්ථාදායකය යි.
(5) ප්‍රජාතන්ත්‍රවාදී රටවල අධිකරණය, අධිකරණ විමර්ශන බලය බුක්තිවිඳී. (......)

15. ශ්‍රී ලංකාව තුළ දේශපාලන පක්ෂ රාශියක් බිහිවීම කෙරෙහි බලනොපෑ හේතුවක් වන්නේ,
(1) සමාජ බහුවිධතාවය.
(2) න්‍යායාත්මක මතභේද පැවතීම.
(3) නවීකරණය වූ දේශපාලන ක්‍රමයක් පැවතීම.
(4) සමනය කළ නොහැකි පන්ති පරතරය.
(5) නියෝජන ක්‍රමය. (......)

16. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතනයක් වන්නේ,
    (1) ලෝක කම්කරු සංවිධානය (ILO)
    (2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
    (3) ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (IBRD/ WB)
    (4) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
    (5) ආරක්ෂක මණ්ඩලය (SECURITY COUNCIL) (......)

17. රාජ්‍ය නොවන සංවිධාන,
    (1) රාජ්‍ය විසින් සම්පූර්ණයෙන් ම හසුරුවනු ලබයි.
    (2) රාජ්‍යයේ නියාමනයෙන් තොරව ක්‍රියාත්මක විය හැකිය.
    (3) රාජ්‍යය විසින් පුරවැසියන්ට සැපයිය යුතු ඇතැම් සේවාවන් ද සැපයීමට දායක වේ.
    (4) සෑම සංවිධානයක් ම ලාභය අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ.
    (5) වර්තමානය වන විට මෙහි ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පවතී. (......)

18. වර්තමාන ජාත්‍යන්තර දේශපාලනය තුළ,
    (1) මැද පෙරදිග රටවල් තීරණාත්මක භූමිකාවක් රඟ දක්වයි.
    (2) ප්‍රධාන බල කඳවුරු දෙකක් දක්නට ලැබේ.
    (3) පැන නැඟී ඇති අර්බුද ලෝක ආර්ථිකයට දැඩි බලපෑමක් නොකරයි.
    (4) තුන්වන ලෝකයේ රටවල බලපෑම ඉහළ මට්ටමක පවතී.
    (5) ඇමරිකානු රාජ්‍යයේ මැදිහත්වීම අඩු මට්ටමක පවතී. (......)

19. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තුළ,
    (1) මෑත කාලීන වශයෙන් ඉන්දියාව කෙරෙහි එතරම් අවධානයක් යොමු කර නැත.
    (2) ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා අද වන විට කේන්ද්‍රීය උපනතිය බවට පත්වී ඇත.
    (3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පාලන සමයේ ජාත්‍යන්තර ධනපති බලවේග සමඟ පමණක් සහයෝගයෙන් කටයුතු කර ඇත.
    (4) එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු ජාත්‍යන්තර වශයෙන් සක්‍රීය මධ්‍යස්ථභාවය පවත්වාගෙන ගොස් ඇත.
    (5) 1965- 1970 අතර කාලයේ දී නොබැඳි ප්‍රතිපත්තිය අනුගමනය කර ඇත. (......)

20. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
    (1) ආරම්භ වූයේ නිදහස ලැබීමත් සමඟය.
    (2) වාමාංශික පක්ෂ ආරම්භයේ සිට අද දක්වා ම සිය ජනප්‍රියතාව රැකගැනීමට සමත්වී ඇත.
    (3) ආරම්භක දේශපාලන පක්ෂය වන්නේ එක්සත් ජාතික පක්ෂය යි.
    (4) සභාග ආණ්ඩු තුළ සුළු පක්ෂවල බලපෑම නිරන්තරයෙන් දක්නට ලැබේ.
    (5) ද්වි පක්ෂ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක වේ. (......)

- අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

21. යටත් විජිත ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල අනුපිළිවෙලින් ගළපා ඇත්තේ,
    A. නිදහස් ශ්‍රම වෙළඳපොළ
    B. ජනාධිපති ආණ්ඩුක්‍රමය හඳුන්වා දීම
    C. 4% ක් වැනි සුළු පිරිසකට දේශපාලනයට සම්බන්ධ වීමට හැකි වීම
    D. පළාතේ නියෝජිතයෙකුට ව්‍යවස්ථාදායකයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම
    E. සුබසාධන සේවාවන් පුළුල් වීම
    (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

22. 1833 කෝල්බෲක් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයේ දේශපාලන ප්‍රතිඵල වූයේ,
   A. මධ්‍යගත පාලන ක්‍රමයක් නිර්මාණය වීම.
   B. ව්‍යවස්ථානුකූල පාලන ක්‍රමයක් නිර්මාණය වීම.
   C. දෙමුහුන් ආර්ථිකයක් නිර්මාණය වීම.
   D. අනාගත පාර්ලිමේන්තු ක්‍රමයකට අවශ්‍ය පදනම වැටීම
   E. ස්වාධීන හා ඒකීය අධිකරණ ක්‍රමයක් නිර්මාණය වීම.
   (1)ABCD (2)ABCE (3)ABDE (4)ACDE (5)BCDE (......)

23. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය හා අදාළ වන්නේ,
   A. වාර්ගික නියෝජනය අහෝසි කිරීම.
   B. 7/10 ක බලයක් ස්වදේශිකයන්ට හිමිවීම.
   C. ප්‍රථම වරට කථානායකධූරයක් හඳුන්වාදීම
   D. සර්ව ජන ඡන්ද බලය අවුරුදු 18 ට වැඩි සියලු දෙනාට ම හිමිවීම.
   E. ආණ්ඩුකාරවරයාගේ බලය සීමා කිරීම.
   (1)ABCD (2)ABCE (3)ABDE (4)ACDE (5)BCDE (......)

24. සෝල්බරි ආණ්ඩු ක්‍රමයට අදාළ පිළිතුරු කාණ්ඩය වන්නේ,
   A. පාර්ලිමේන්තුවේ නිල කාලය අවුරුදු 05 කි.
   B. අධිකරණ ඇමති ධූරය සෙනෙට් සභාවෙන් තෝරා ගන්නා ලදි.
   C. ව්‍යවස්ථා ප්‍රකාරව ව්‍යවස්ථා විවරණ බලය අධිකරණයට හිමි නොවිය.
   D. රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පත්කරන ලදි.
   E. අවසාන අභියාචනාධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි විය.
   (1)ABCD (2)ABCE (3)ABDE (4)ACDE (5)BCDE (......)

25. ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩු ක්‍රමයේ දී,
   A. බලතල බෙදීමේ මූලධර්මය පදනම් කරගන්නා ලදි.
   B. ජනතා පරමාධිපත්‍ය සහිත සමූහාණ්ඩු පාලන ක්‍රමයක් නිර්මාණය කරන ලදි.
   C. ඒකීය රාජ්‍ය ක්‍රමය පිළිගන්නා ලදි.
   D. බ්‍රිතාන්‍ය සමඟ පැවති ව්‍යවස්ථාමය සබඳතා අත්හරින ලදි.
   E. මුල්වරට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හඳුන්වා දෙන ලදි.
   (1)ABCD (2)ABCE (3)ABDE (4)ACDE (5)BCDE (......)

• අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3),(4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26 | 1978 මුල් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව අගමැති ධූරය බලවත් විය. | 18 වන සංශෝධනයෙන් තොරතුරු දැනගැනීමේ මූලික අයිතිය තහවුරු කරන ලදි. | (....) |
| 27 | 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය අභියාචනාධිකරණයට හිමි වේ. | 1978 ව්‍යවස්ථාවට අනුව ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය හිමි වන්නේ ද අභියාචනාධිකරණයට යි. | (....) |
| 28 | මුල් ව්‍යවස්ථාව අනුව වසර හතර හමාරකින් පසු ජනාධිපතිට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක. | 20 වන සංශෝධනය අනුව ද්විත්ව පුරවැසියන්ට වුවද ජනාධිපති ධූරය සඳහා තරග කළ හැක. | (....) |
| 29 | 21 වන සංශෝධනය යටතේ පාර්ලිමේන්තු සභාව අහෝසි කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යළි ස්ථාපිත කරන ලදි. | 21 වන සංශෝධනය යටතේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා විගණන සේවා කොමිෂන් සභාව යළි ස්ථාපිත කරන ලදි. | (....) |
| 30 | 19 වන සංශෝධනය අනුව ජනාධිපතිවරයාට කිසිදු අමාත්‍ය ධූරයක් දැරිය නොහැක. | විශේෂ විධිවිධාන යටතේ එතෙක් ජනාධිපතිවරයා දරමින් සිටි අමාත්‍ය ධූර එම ජනාධිපතිවරයාට පමණක් දැරිය හැකි විය. | (....) |

**B කොටස**

31. ඇරිස්ටෝටල් ආණ්ඩුවේ ස්වභාවය වර්ග කිරීම සඳහා මිණුම් දඬු දෙකක් භාවිතා කළේය. ඒවා නම් කරන්න.
(1)..........
(2) ..........

32. දේශපාලන පක්ෂ බිහිවීම සඳහා පසුබිම් වූ ප්‍රධාන සාධක දෙක නම් කරන්න.
(1)..........
(2)..........

33. පහත කෘතිවල කතුවරුන් නම් කරන්න.
(1) ලෙවියාතන් - ..........
(2) මගේ සටන - ..........

34. නිරාගමිකවාදය ලෝක දේශපාලනයට අදාළ වීමට බලපාන කරුණු දෙක ලියන්න.
(1) ..........
(2)..........

35. ප්‍රතිසන්ධානගත වීම මට්ටම් තුනකින් සිදුවීම අවශ්‍ය වේ. ඉන් දෙකක් දක්වන්න.
(1) ..........
(2) ..........

36. ආණ්ඩුවේ වගවීම පිළිබඳ අදහසට මාන දෙකක් පවතී. ඒවා නම් කරන්න.
(1) ..........
(2) ..........

37. ආර්ථිකය මත පදනම් වූ දේශපාලන මතවාද දෙකක් ලියන්න.
(1) ..........
(2) ..........

38. ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෝෂණය වීම කෙරෙහි බල පා ඇති සාධක දෙකක් නම් කරන්න.
(1) ..........
(2) ..........

39. රාජ්‍ය ප්‍රතිපත්තිය හා බැඳුණු සංකල්ප තුනෙන් දෙකක් ලියන්න.
(1) ..........
(2) ..........

40. ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය තීරණය වීමෙහිලා බලපාන තීරණාත්මක පාරිසරික බලපෑම් දෙකක් ලියන්න.
(1) ..........
(2) ..........

41. (1) ඊජිප්තුවේ හොස්නි මුබාරක්ගේ පාලනය පෙරළා දැමීම සඳහා සංවිධානය වූ ව්‍යාපාරය හැඳින්වූ නම කුමක්ද?
..........
(2)ජාත්‍යන්තර මට්ටමෙන් දේශපාලන හා සමාජ ක්‍රියාකාරීත්වය පෙළගැස්වීමේ විකල්ප බලවේගය හඳුන්වන්නේ කුමන නමකින්ද?
..........

42. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙන් සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීමට බලපෑ හේතු දෙකක් ලියන්න.
(1) ..........................................................................................................................
(2) ..........................................................................................................................

43. ශ්‍රී ලංකාවේ යටත් විජිත ආර්ථික හා සමාජ පරිවර්තනය තල දෙකක් යටතේ සිදුවිය. එම දෙක ලියන්න.
(1) ..........................................................................................................................
(2) ..........................................................................................................................

44. පහත සඳහන් රාජ්‍ය මාදිලි නම් කරන්න.
(1)නිදහසින් පසුව ද යටත් විජිත ව්‍යුහය තවදුරටත් ඉදිරියට ගෙන ගිය රාජ්‍ය මාදිලිය
..........................................................................................................................
(2)1920 - 1930 දශකවලදී ලෝක දේශපාලනය උඩු යටිකුරු කළ රාජ්‍ය මාදිලිය
..........................................................................................................................

45. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.
(1)..........................................................................................................................
(2)..........................................................................................................................

46. පහත ප්‍රකාශ හා සම්බන්ධ සංකල්ප නම් කරන්න.
(1) දේශපාලන වශයෙන් නිදහස් ජනතාවකට, තම දේශපාලන කැමැත්ත සහ අධිෂ්ඨානය ප්‍රකාශ කිරීමට ඇති ඉතාම වැදගත් යාන්ත්‍රණය.
..........................................................................................................................
(2) එක් එක් ආණ්ඩු ආයතන භුක්ති විඳින බලතල, අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළැක්වීම සඳහා මෙය භාවිතයට ගත හැකිය.
..........................................................................................................................

47. සෝල්බරි ආණ්ඩු ක්‍රමය, බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයෙන් වෙනස් වන ලක්ෂණ දෙකක් ලියන්න.
(1)..........................................................................................................................
(2)..........................................................................................................................

48. සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ පැවති අධිකරණ සේවා කොමිෂන් සභාව වෙනුවට 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ පිහිටවූ ආයතන දෙක ලියන්න.
(1)..........................................................................................................................
(2)..........................................................................................................................

49. (1)ශ්‍රී ලංකාවේ පළාත් සභාවක විධායක බලය හිමි නිළ තනතුර නම් කරන්න.
..........................................................................................................................
(2)ශ්‍රී ලංකාවේ පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කොපමණද?
..........................................................................................................................

50. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන වගන්තියට අනුව පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථාදායක බලය සීමා වන අවස්ථා දෙක ලියන්න.
(1)..........................................................................................................................
(2)..........................................................................................................................

***

# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

| 23 | S | II |
|---|---|---|

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විතය.

* **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### I කොටස

1. දේශපාලනය හැදෑරීමේ දාර්ශනික- ප්‍රතිමානීය ප්‍රවේශය හෝ අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)

2. රාජ්‍ය පිළිබඳ පහත සඳහන් දේශපාලන සංකල්ප විස්තර කරන්න.
   I. රාජ්‍ය සහ ස්වාධිපත්‍ය (ලකුණු 10)
   II. රාජ්‍ය සහ පුරවැසියා (ලකුණු 10)

3. සන්ධීය ආණ්ඩු ක්‍රමය හා සම්බන්ද පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   I. ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩු ක්‍රම පිහිටුවා ගැනීමේ මාර්ග කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)
   II. සන්ධීය ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 15)

### II කොටස

4. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මඟින් හඳුන්වා දුන් සර්වජන ඡන්ද බලයේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 20)

5. සෝල්බරි ආණ්ඩු ක්‍රමය සහ ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවය සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 20)

6. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව පහත මාතෘකා සාකච්ඡා කරන්න.
   I. ජනාධිපතිවරයා පත්කිරීමේ පටිපාටිය (ලකුණු 10)
   II. ජනාධිපති සහ පාර්ලිමේන්තුව අතර පවත්නා සබඳතාවය (ලකුණු 10)

7. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ විවේචන සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**III කොටස**

8. ඒකීය රාජ්‍යවල පරිවර්තනය බ්‍රිතාන්‍ය හා ශ්‍රී ලංකාව ඇසුරින් සංසන්දනාත්මකව විස්තර කරන්න.
(ලකුණු 20)

9. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ සංකල්පීය පදනමක් වන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණ විස්තර කරන්න.
(ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ජාතික බලය හා ජාතික අභිලාෂ
II. පැසිස්ට්වාදය
III. ප්‍රතිපත්ති ක්‍රියාදාමය
IV. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අභියෝග
V. සමාජ සම්මුතිවාදය

(ලකුණු 10 x 2= 20)

අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

දේශපාලන විද්‍යාව අනුහුරු පිළිතුරු පත්‍රය - 2024

**1 පත්‍රය** **A කොටස**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01 | 5 | 11 | 5 | 21 | 4 |
| 02 | 3 | 12 | 4 | 22 | 3 |
| 03 | 4 | 13 | 2 | 23 | 2 |
| 04 | 5 | 14 | 1 | 24 | 1 |
| 05 | 2 | 15 | 3 | 25 | 5 |
| 06 | 1 | 16 | 5 | 26 | 4 |
| 07 | 1 | 17 | 3 | 27 | 2 |
| 08 | 3 | 18 | 1 | 28 | 3 |
| 09 | 2 | 19 | 2 | 29 | 1 |
| 10 | 4 | 20 | 4 | 30 | 5 |

**B කොටස**

31. 1. පාලකයින්ගේ සංඛ්‍යාව
2. ආණ්ඩුව දූෂිතද යන්න

32. 1. නියෝජන ආණ්ඩු ක්‍රමයේ ව්‍යාප්තිය
2. ඡන්ද බලයේ ව්‍යාප්තිය

33. 1. තෝමස් හොබ්ස්
2. ඇඩොල්ෆ් හිට්ලර්

34. 1. ආගමික මූලධර්මවාදය පදනම් කොටගත් ආගමික රාජ්‍ය බිහිවීමේ හැකියාව
2. බහු සංස්කෘතිකවාදය පදනම් කොට ගෙන ආගමික අනන්‍යතාව මත සුළු ජන ප්‍රජාවගේ අයිතිවාසිකම ආරක්ෂා කිරීම

35. 1. මනෝ විද්‍යාත්මක ක්‍රියාමාර්ග
2. සමාජීය ක්‍රියාමාර්ග
3. දේශපාලන ක්‍රියාමාර්ග

36. 1. ජනතාවට උත්තර දිය යුතු බව
2. වගකීමේ අර්ථයෙන් ක්‍රියා කිරීම

37. 1. ලිබරල්වාදය
2. සමාජවාදය

38. 1.කොංග්‍රස් පනත්
2. සාම්ප්‍රදායික සිරිත් විරිත්
3. අධිකරණ තීන්දු

39. 1. ප්‍රතිපත්ති විශ්ලේෂණය
2. ප්‍රතිපත්ති උපදේශනය
3. ප්‍රතිපත්ති නායකත්වය

40. 1. ගෝලීය උණුසුම
2. ජල හිඟය
3. ස්වාභාවික ව්‍යසන

4. සෞඛ්‍ය ගැටලු

41. 1. අරාබි වසන්තය
2. නව සමාජ ව්‍යාපාර

42. 1. පීඩාවට පත් ජන කොටස් නගා සිටුවීම
2. ගම හා නගරය අතර පැවති අසමතුලිත බව නැති කිරීම
3. නැගී එමින් පැවති සමාජවාදී ව්‍යාපාරය අඩපණ කිරීම
4. සමාජ ප්‍රභූන්ගේ දේශපාලන කතිපයාධිකාරී බලය මර්ධනය කිරීම.
5. උතුරු ප්‍රදේශයේ "හරි ජනයාගේ " තත්ත්වය නගාසිටුවීම.

43. 1. යටත්විජිත ධනවාදයේ ආරම්භය හා ව්‍යප්තිය
2. යටත් විජිත සමාජ පරිවර්ථනය

44. 1. පශ්චාත් යටත් විජිත රාජ්‍ය මාදිලිය
2. පැසිස්ට්වාදී රාජ්‍ය මාදිලිය

45. 1. ජනාධිපති ජනතා ඡන්දයෙන් පත්කිරීම
2. ජනාධිපතිට සැළකිය යුතු විධායක බලතල හිමි වීම
3. විධායක බලතල සහිත කැබිනට් මණ්ඩලයක් පැවතීම
4. පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත ඇති තෙක් කැබිනට් මණ්ඩලය ධූර දැරීම

46. 1. නිදහස් හා සාධාරණ මැතිවරණ
2. සංවරණ හා තුළන ක්‍රමය

47. 1. ලිඛිත ව්‍යවස්ථාවක් තිබීම
2. අනම්‍ය ව්‍යවස්ථාවක් තිබීම
3. ව්‍යවස්ථා විවරණ බලය සීමිත සහ අප්‍රකාශිත ලෙස අධිකරණයට හිමිවීම

48. 1. අධිකරණ සේවා උපදේශක මණ්ඩලය
2. අධිකරණ සේවා විනය මණ්ඩලය

49. 1. ආණ්ඩුකාරධූරය
2. 05

50. 1. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හෝ එහි කොටසක් අත්හිටුවන නීති පැනවිය නොහැකි බව.
2. නව ව්‍යවස්ථාවක් පනවන්නේ නම් මිස ව්‍යවස්ථාව මුළුමනින්ම පරිච්ඡින්න කරන නීති පැනවිය නොහැකි බව.

**11 පත්‍රය පිළිතුරු**

01\. 1. දේශපාලනය හැදෑරීමේ දාර්ශනික- ප්‍රතිමානීය ප්‍රවේශය විස්තර කරන්න.

- දේශපාලන අධ්‍යයනය සඳහා යොදාගත් මුල්ම ප්‍රවේශය බව
- මෙහි පුරෝගාමීන් ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් බව
- මෙම ප්‍රවේශයේ ප්‍රධාන ප්‍රකාශකයෝ සිසරෝ, ශාන්ත ඔගස්ටීන්, මැකියාවෙලී, තෝමස් හොබ්ස් , ලොක්, එම්මානුවෙල් කාන්ට්, හේගල් යන අයගෙන් කීපදෙනෙක් නම්කර තිබීම
- 20 වන සියවසේ චින්තකයින් සඳහන් කිරීම. මහත්මා ගාන්ධි, හැනා ඇරෙන්ඩ්ට් නම්කර තිබීම
- මෙහි පොදු ප්‍රධාන කරුණු දෙක සඳහන් කළයුතු බව
  1.ඔවුන් දේශපාලන විද්‍යාඥයින් නොව දේශපාලන දාර්ශනිකයන් වීම
  2. ඔවුන් හැම දෙනාම දේශපාලනය යන ප්‍රපංචය දෙස බැලුවේ ප්‍රතිමානීය දෘෂ්ඨිකෝණයකින් වීම

- දර්ශනවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ තුන පැහැදිලි කිරීම
- දේශපාලන දර්ශනවාදයේ ප්‍රතිමානීය සංකල්පය තරමක් ඉහළ මට්ටමේ අර්ථ දෙකක් ඇඟවීම සඳහා භාවිත කරණ කරුණු දෙක පැහැදිලි කර තිබීම
- සෑම දේශපාලන දාර්ශනිකයෙකුගේම චින්තනය වූ කලී මෙම ප්‍රතිමානීය අරමුණු දෙක වෙතින් හැඩගැස්වී ඇති බව ලිවිය යුතුය.

**අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය**

- සම්පූර්ණයෙන්ම අනන්‍ය වී ඇත්තේ මාක්ස්වාදී න්‍යාය හා ප්‍රවේශය සමග බව
- මුලින්ම භාවිත වූයේ 18 සියවසේ යුරෝපීය චින්තකයින් අතර බව
- මුල් කාලීන න්‍යාය පත්‍රය විග්‍රහ කිරීම
- ප්‍රධාන චින්තකයින් දැක්විය යුතුය
- කාල් මාක්ස් දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ මෙම සාම්ප්‍රදායික වටහාගැනීම වෙනස් කළ අයුරු සඳහන් කළ යුතුය.
- ඓතිහාසික භෞතිකවාදී ප්‍රවේශයේ ප්‍රධාන අංගෝපාංග සඳහන් කළ යුතුය
- දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට පැමිණියේ ආනුභවික ප්‍රත්‍යක්ෂ මූලවාදී චර්යාවාදී දේශපාලන විද්‍යා ප්‍රවේශයට විකල්පයක් වශයෙන් බව
- විවේචන ලියා ලිබිය යුතුය.
- විකල්ප දේශපාලන විද්‍යා ප්‍රවේශයේ ලක්ෂණ හා පැතිකඩ විස්තර කර තිබීම.

02. **I.** **රාජ්‍ය සහ ස්වාධිපත්‍ය**

- ස්වාධිපත්‍ය යනු රාජ්‍ය සතු උත්තරීතර බලය බව දැක්වීම.
- ජීන් බොඩෑන් "රාජ්‍ය පිළිබඳ ග්‍රන්ථ හයක්" කෘතියේ ස්වාධිපත්‍ය සංකල්පය න්‍යායාත්මකව ඉදිරිපත්කළ බව
- ස්වාධිපත්‍ය සංකල්පයේ ප්‍රධාන පැතිකඩ දෙක ( අභ්‍යන්තර හා බාහිර) විස්තර කිරීම
- බොඩෑන්ගේ ස්වාධිපත්‍ය සංකල්පය තුළ ඇති මූලික ගුණාංග තුන විස්තර කිරීම (ඒකීය බව, බෙදිය නොහැකි බව, පැවරිය නොහැකි බව)
- ස්වාධිපත්‍ය සංකල්පය පිළිබඳ වෙනත් චින්තකයින්ගේ අදහස් කෙටියෙන් දැක්වීම ( හොබ්ස් , ලොක්, රූසෝ,මැකියාවෙලී,හියුගෝ ග්‍රෝෂස් )
- ස්වාධිපත්‍ය සංකල්පය පිළිබඳ පැහැදිළිව හා ක්‍රමවත්ව නීතිමය නිර්වචනයක් ඉදිරිපත් කරන්නේ ජෝන් ඔස්ටින් බව
- ස්වාධිපත්‍ය සංකල්පය සන්ධීයවාදය හා ගෝලීයකරණ ක්‍රියාවලිය යටතේ අභියෝගයට ලක්වී ඇති බව
- මේ නිසා අද වන විට ප්‍රබල රාජ්‍යයන්හි ස්වාධිපත්‍ය වර්ධනය වී දුබල රාජ්‍යයන්හි ස්වාධිපත්‍ය නාය යාමට ලක්ව ඇති බව විස්තර කිරීම ප්‍රමාණවත් වේ.

II. රාජ්‍ය සහ පුරවැසියා

- පුරවැසියා යන්නෙහි ග්‍රීක අදහස හා නූතන අදහස දැක්වීම
- ග්‍රීක නගර රාජ්‍යයෙහි පුරවැසියා නගර රාජ්‍යයෙහි දේශපාලන කටයුතුවලට සෘජුවම සම්බන්ධ වූ බවත් නූතයේ දී නියෝජිතයන් මාර්ගයෙන් සම්බන්ධ වන බවත් දැක්වීම.
- එක් එක් රටවල ආණ්ඩුවල ස්වභාවය අනුව පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වයේ ස්වභාවය තීරණය වන බව (හමුදා ආණ්ඩු, රාජාණ්ඩු,සමාජවාදී ආණ්ඩු,ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු)
- මෙහිදී චක්‍රාකාරව හෝ පුරවැසියන් දේශපාලන කටයුතුවලට වැඩි වැඩියෙන් සම්බන්ධ වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු තුළ බව දැක්වීම
- පුරවැසියන් නොමැතිව රාජ්‍යයක්ද, රාජ්‍යයක් නොමැතිව පුරවැසියන්ද සමාජය තුළ පැවතිය නොහැකි බව සහ කිසියම් පුද්ගලයෙකුට පුරවැසිභාවය හිමිවෙනවාද නැද්ද යන්න තීරණය කරන්නේ රාජ්‍ය බව
- රාජ්‍ය සහ පුරවැසියා අතර සම්බන්ධතාවයේ කැපී පෙනෙන ලක්ෂණ දෙක දැක්වීම
- රාජ්‍යයට පුරවැසියා අවනත විය යුතුතේ ඇයි? යන්නට විවිධ චින්තකයන් ඉදිරිපත්කර ඇති කරුණු කෙටියෙන් දක්වා තිබීම ප්‍රමාණවත් වේ.

**03. I. ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩු ක්‍රම පිහිටුවා ගැනීමේ මාර්ග කෙටියෙන් දක්වන්න**

- පොදු අභිලාෂයන් හඹා යාම පිණිස කලින් වෙන්ව පැවති ඒකක එකට එකතුව මධ්‍යම අධිකාරියක් නිර්මාණය කරගැනීම
- බෙදුන රටක් එකට එකතු වීමෙන් සන්ධීය පාලන ක්‍රමයක් ලෙසින් ප්‍රතිව්‍යුහගත වීම
- ඒකීය රාජ්‍යයක් වාර්ගික හා සංස්කෘතික විවිධත්වය මත සන්ධීය රාජ්‍යක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම( ඉහත කරුණු කෙටියෙන් පැහැදිළි විය යුතුය.)

II. සන්ධීය ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ පැහැදිළි කරන්න.

- ස්වායත්ත ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විත බව එනම් මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු ලෙස
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු වෙන වෙනම බලතල හිමිකරගෙන ඇති බව
- මධ්‍යම රජයට හා ප්‍රාන්ත ඒකක වලට විශේෂිත කාර්යයන් පැවරී තිබීම
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර සහයෝගීතාවය ගොඩනැගීමේ අරමුණෙන්ද මධ්‍යම ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට ප්‍රාන්ත ආණ්ඩු සම්බන්ධකරගැනීම පිණිසද මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලිකවාදය මත පදනම් වීම (උදා- සෙනෙට් මණ්ඩලය)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිමත් විධිවිධාන අර්ථ නිරූපණය කරනු ලබන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි.
- ඒකීය ආණ්ඩු ක්‍රමය විකාශනාත්මක මාදිළියක් වන අතර සන්ධීය ආණ්ඩු ක්‍රමය සුවිශේෂී තත්ත්වයක් යටතේ හිතා මතා සකස් කර ගැණුනක් බව
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ලිඛිත වීම හා අනම්‍ය වීම අනිවාර්යය වීම.
  (මෙම කරුණු විස්තර කර තිබිය යුතුය)

04. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මඟින් හඳුන්වා දුන් සර්වජන ඡන්ද බලයේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

- පිළිතුරෙහි ප්‍රවේශය සඳහන් කර පහත ප්‍රතිඵල විස්තරාත්මකව දක්වා තිබීම
  - I. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරු පුරුදු වීම
  - II. වගකීමේ ආණ්ඩු ක්‍රමයකට හුරුපුරුදු වීම
  - III. දේශපාලන පක්ෂ ආරම්භ වීමේ පදනම වැටීම
  - IV. සමාජ සජීවීකරණය වේගවත් වීම
  - V. මධ්‍යම පාන්තික ජනතාව හා සාමාන්‍ය ජනතාව අතර පැවති පන්ති පරතරය අඩු වීම
  - VI. සමාජ සුබසාධනය වේගවත් වීම

  ..................... ආදී කරුණු විස්තර කර තිබීම ප්‍රමාණවත් වේ.

05. **සෝල්බරි ආණ්ඩු ක්‍රමය සහ ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවය සංසන්දනාත්මකව විමසන්න.**

- සෝල්බරි රාජ්‍ය සේවය ඉහළ සහ පහළ යනුවෙන් ස්ථර දෙකක් ඇති බව
- ඉහළ රාජ්‍ය නිළධාරීන් පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහ කිරීම, විනය පාලනය ආදී බලතල අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා සිදු කරන බව සහ පහළ මට්ටමේ අනෙකුත් නිළධාරීන් සම්බන්ධ ඉහත බලතල ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂම ස්ථාපිත කළ බව
- රාජ්‍ය සේවා කොමිෂම පත්කිරීමට බලපෑ හේතු , නිළ කාලය, සංයුතිය, බලතල, ඉවත්කිරීම සම්බන්ධ ව්‍යවස්ථාපිත විධිවිධාන දැක්වීම
- රාජ්‍ය සේවා කොමිෂමේ ස්වාධීනත්වය සඳහා ගෙන තිබූ පියවරයන් දැක්වීම
- මෙලෙස පියවරයන් ගත්තද රාජ්‍ය සේවා කොමිෂමේ ස්වාධීනතාවය මුලුමනින්ම ආරක්ෂා කිරීමට නොහැකි වූ බවත් දැඩි නිළධාරීවාදයක් ඉස්මතුවූ බව දැක්වීම
- ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවය අමාත්‍ය මණ්ඩලයට පවරා තිබූ බව.
- ඉහළ රාජ්‍ය නිළධාරීන් පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහ කිරීම, විනය පාලනය ආදී බලතල අගමැතිගේ උපදෙස් මත ජනාධිපතිවරයා සිදු කරන බව සහ පහළ මට්ටමේ අනෙකුත් නිළධාරීන් සම්බන්ධ ඉහත බලතල ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂම අහෝසි කොට ඒ වෙනුවට මණ්ඩල දෙකක් ස්ථාපිත කළ බව

- එම මණ්ඩල දෙක පත්කිරීම, නිළ කාලය, සංයුතිය, බලතල, ඉවත්කිරීම සම්බන්ධ ව්‍යවස්ථාපිත විධිවිධාන දැක්වීම
- අවසානයේ මෙකී මණ්ඩලවල තීරණ ස්ථිර කිරීමටත් වෙනස් කිරීමටත් අමාත්‍ය මණ්ඩලයට බලය ඇති බව දැක්වීම.
- මේ අනුව 1948 සිට යම් ප්‍රමාණයකින් හෝ ස්වාධීන වූ රාජ්‍ය සේවය 1972 ආණ්ඩුක්‍රමය යටතේ දේශපාලනීකරණය වූ බව දක්වා පිළිතුර නිමා කළ හැක.

06 . **I. ජනාධිපතිවරයා පත්කිරීමේ පටිපාටිය**

- ජනාධිපති තෝරා පත්කරගැනීම සඳහා සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ජනාධිපතිවරණයක් පවත්වන බව
- ජනාධිපති අපේක්ෂකයෙකු වීම සඳහා තිබිය යුතු සුසුදුකම් දක්වා තිබීම
- 30 (2) වගන්තිය පරිදි නිළ කාලය( සංශෝධන පදනම් කරගන්න )
- ජනාධිපති අපේක්ෂකත්වය සඳහා ඉදිරිපත්විය හැකි ආකාර දෙක
- මෙම තෝරා පත්කිරීම ව්‍යවස්ථා විධිවිධාන අනුව බහුත්ව ක්‍රමයට අයත්වන අතිරේක ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමය මත පදනම් වන බව
- ඡන්ද ප්‍රකාශ කිරීමේ රටාව ඉදිරිපත් වී ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව අනුව තීරණය වන බව දක්වා එය විස්තර කර තිබීම
- ප්‍රකාශිත වලංගු ඡන්දවලින් නියත බහුතරය ලබාගත් තැනැත්තා ජනාධිපති වශයෙන් තේරීපත් වන බවත් එසේ නොවුන හොත් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග විස්තර කර තිබීම.
- මෙම ක්‍රමයේ වාසි අවාසි දක්වා පිළිතුර අවසන් කළ හැකිය.

**II. ජනාධිපති සහ පාර්ලිමේන්තුව අතර පවත්නා සබඳතාවය**

- මාතෘකාවට අදාළ ප්‍රවේශයක් දක්වා තිබීම
- පහත කරුණු යටතේ පාර්ලිමේන්තුව සම්බන්ධ ජනාධිපතිවරයාගේ බලපෑම දැක්වීම
  - I. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු මෙන්ම ප්‍රධානියා ලෙස පනත් කෙටුම්පත් පිළියෙළ කිරීමට සම්බන්ධ වීම
  - II. පණත් කෙටුම්පත් සම්බන්ධව පාර්ලිමේන්තු විවාදයන්ට සම්බන්ධ වීම
  - III. පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීම
  - IV. පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම (ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව)
  - V. කවර වූ හෝ අවස්ථාවක පාර්ලිමේන්තුව ඇමතීමට , සංදේශ යැවීමට හැකි වීම
  - VI. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
  - VII. ජනමත විචාරණ මගින් යම් යම් යෝජනා ජනතාවට ඉදිරිපත් කර නීති සම්පාදනය කර ගැනීම (ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව)
  - VIII. කැබිනට් ඇමතිවරු හා නියෝජ්‍ය ඇමතිවරු පත්කරමින් ඔවුන්ගේ සහය මත අණ පනත් නිර්මාණය කරගැනීම.
- නිගමනය - මේ අනුව පාර්ලිමේන්තුව දුර්වල ආයතනයක් වන බව සඳහන් කර පාර්ලිමේන්තුවට ජනාධිපති සම්බන්ධව කළ හැකි එකම බලපෑම දෝෂාභියෝගය බවත්, එය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බවත් සඳහන් කර තිබීම ප්‍රමාණවත් වේ.

**07. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ විවේචන සාකච්ඡා කරන්න.**

- 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව එහි ආරම්භයේ පටන් විවේචනයට ලක් වූවක් බව සඳහන් කළයුතුය.
- එම විවේචන බොහොමයකට සංකල්පීය පදනම වූයේ
  - I. එහි මූලික ව්‍යුහය
  - II. එහි අභිලාෂයන් , ප්‍රජාතන්ත්‍ර විරෝධීය යන්නයි.
- විධායක ඒකාධිපතිත්වයක් කරා ගමන් කළ හැකි බලගතු විධායක ජනාධිපති ධූරයක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්ථාපිත කර ඇති බව
- ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය යළි ස්ථාපිත කිරීමට නම් මෙම ව්‍යවස්ථාව අවලංගුකර අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කළයුතු බවට ප්‍රබල දේශපාලන මත ගොඩ නැගුන බව උදා- විපක්ෂ දේශපාලන පක්ෂ, සිවිල් සමාජ බලවේග, ජනමාධ්‍ය, ජනතාව
- මහජන විවේචන ප්‍රධාන වශයෙන් එල්ලවූ අංශ සඳහන් කළයුතුය. (98 පිටුව)
- 13 සහ 18 ව්‍යවස්ථා සංශෝධනයන්ට විරුද්ධව ගොඩනැගුන තර්ක එනම්,
- 13 ව්‍යවස්ථා සංශෝධනයට සුළු ජන කොටස්වලත් වාමාංශික පක්ෂ වලත් සහයෝගය ලැබුනත් ශ්‍රී.ලං.නි.ප. හා ජ.වි.පෙ. එයට විරුද්ධ වීම
- 18 ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ප්‍රධාන විවේචනය නම් එය නිර්-ප්‍රජාතන්ත්‍රවාදී සහ අධිකාරවාදී ප්‍රවනතා වඩාත් ශක්තිමත් කළේය යන්නයි.
- නව ව්‍යවස්ථාවක් පැනවීමට 1994 සිට ප්‍රයත්න කීපයක් ගත්තද එය සාර්ථක නොවුන බව
- විධායක ජනාධිපති ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය ගැන එල්ල වී ඇති විවේචනත් ඒවා වෙනුවට ඉදිරිපත් වී ඇති විකල්ප ගැනත් සංශෝධනය කිරීමට ගත් ප්‍රයත්න ගැනත් කෙටි හැඳින්වීමක් පිළිතුරෙහි අඩංගු වී තිබිය යුතු බව
- 20 වන සංශෝධනය යටතේ නැවතත් ජනාධිපතිධූරය බලවත් කිරීම සහ ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධව ඇති විවේචන
- 1994 සිට විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට ජනතාවට පොරොන්දු දී බලයට පත්වන සෑම පක්ෂයක්ම සුළු සංශෝධන ඉදිරිපත්කර තවදුරටත් මෙම ක්‍රමය පවත්වාගෙන යන බව සඳහන් කරමින් නිගමනයක් ලබා දිය හැකිය.

08. ඒකීය රාජ්‍යවල පරිවර්ථනය බ්‍රිතාන්‍ය හා ශ්‍රී ලංකාව ඇසුරින් සංසන්දනාත්මකව විස්තර කරන්න.

- බ්‍රිතාන්‍ය විශේෂිත අනන්‍යතා පදනම්ව ඇති බව (උදා- එංගලන්තය,උතුරු අයර්ලන්තය, ස්කොට්ලන්තය, වේල්සය)
- උතුරු අයර්ලන්තය, ස්කොට්ලන්තය, වේල්සය යන කොටස් රාජ්‍යයන්වල වාර්ගික අනන්‍යතා ශක්තිමත් බව දැක්වීම
- ආරම්භයේ මෙකී රාජ්‍යයන් ස්වාධිනව පැවති බව දැක්වීම
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හරහා ලංකාව ඒකීය පාලන ක්‍රමයකට නතු වූ බව
- ලංකාවේද සුළු ජනවර්ගවල ඉල්ලීම් යටත් විජිත පාලනය ආරම්භයේ පටන්ම පැවති බව (සිංහල ජනවර්ගය හා සමාන නියෝජන අවස්ථා සුළු ජනවර්ගවලටත් ලැබිය යුතු බව)
- 1970 දශකයෙන් පසු ජනවාර්ගික අරගලයකට මුල පිරූ බව සහ 1980 දශකයේ එය යුධමය තත්ත්වයක් දක්වා වර්ධනය වූ බව දැක්වීම
- 1998 න් පසු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සම්මත කළ පනත් හරහා බලය විමධ්‍යගත කළ බව හා එය සමමිතික අයුරින් සිදු නොවූ බව දැක්වීම
- 1987 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ 13 වන සංශෝධනයෙන් ලංකාව තුළද පළාත් සභා පිහිටුවා බලය විමධ්‍යගත කිරීමක් සිදුවූ බව සහ පළාත් පාලන ආයතනවල කටයුතු අධීක්ෂණය පළාත් සභාවට පැවරූ බව
- මෙහිදී බලය විමධ්‍යගත කිරීම ලැයිස්තු තුනකින් සිදුවූ බව
- පළාත් සභා වෙත විමධ්‍යගත කොට ඇති ඇතැම් බලතල මධ්‍යම ආණ්ඩුව රඳවාගෙන සිටීම
- බ්‍රිතාන්‍ය හා ලංකාව තුළ බලය විමධ්‍යගත කිරීමේ දී දක්නට ලැබෙන සමාන ලක්ෂණ
  - I. රටවල් දෙකම ඒකීය රාජ්‍යයේ සිට පරිවර්තනය වීම

II. බ්‍රිතාන්‍ය තුළ උතුරු අයර්ලන්තය, ස්කොට්ලන්තය, වේල්සය යන කොටස් රාජ්‍යයන්ටත් ලංකාවේ පළාත් සභා නවයටත් බලය විමධ්‍යගතකොට තිබීම

III. දෙරටම බහුවාර්ගික රාජ්‍යයන් වීම

IV. දෙරටම බලය විමධ්‍යගත කර ඇති ආකාරය පිළිබඳ තෘප්තිමත් නොවීම

- බ්‍රිතාන්‍ය හා ලංකාව තුළ බලය විමධ්‍යගත කිරීමේ දී දක්නට ලැබෙන වෙනස්කම්

  I. බ්‍රිතාන්‍ය තුළ බලය විමධ්‍යගත කිරීම අසමමිතික වන අතර ලංකාව තුළ සමමිතික වීම

  II. බ්‍රිතාන්‍ය තුළ පාර්ලිමේන්තුවට ගෙන ආ පනත් මඟින්ද, ලංකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ද බලය විමධ්‍යගත කොට තිබීම

- මේ අනුව මෙකී රාජ්‍යයන් දෙකෙහිම බලය විමධ්‍යගත කිරීමේදී ඒකීය රාජ්‍ය පරිවර්තනයකට ලක්වී ඇති අතර සන්ධීය ක්‍රමයක් දක්වා ව්‍යාප්තව නැත. මේ දෙකට අතරමැදි තත්ත්වයක බලය විමධ්‍යගත කිරීමක් සිදුවී ඇති බව පැහැදිලි වන අතර මධ්‍යම ආණ්ඩුව තවදුරටත් තීරණාත්මක සාධකය වන බව පෙන්වා දිය හැක.

09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ සංකල්පීය පදනමක් වන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය විස්තර කරන්න

- දිගු ඉතිහාසයකට හිමිකම් නොකියන, වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදය නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය බව පැහැදිලි විය යුතුය
- මෙය පළමුව යුරෝපයේ බිහි වී වැඩවසම් ආණ්ඩුවලට විකල්පයක් ලෙස ඉදිරියට ආ සංකල්පයක් බව
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භයට පෙර පැවති ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සෘජු ප්‍රජාතන්ත්‍රවාදයයි.
- මෙහි පැවති ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වූයේ කාන්තාවන්, ළමයින් සහ වහලුන් හැර සියලු පුරවැසියන් ආණ්ඩු පාලනයට කෙලින්ම සම්බන්ධ වීමෙන් දක්වන සෘජු සහ අඛණ්ඩ සහභාගීත්වයයි.
- එහිදී ආණ්ඩුව වූයේ පුරවැසි බලය හිමි ජනතාවයි. සෘජු ප්‍රජාතන්ත්‍රවාදයත් නූතන ප්‍රජාතන්ත්‍රවාදයත් අතර විශාල වෙනසක් පවතින බව උදාහරණ තුළින් පැහැදිලි කළයුතු බව
- නූතන රාජ්‍යයන් හි භූමිය විශාල වීම, ජනගහණය වැඩිවීම, එක්රුස් වීමේ අපහසුතාව , දේශපාලනය හා සම්බන්ධ ජනතාවගේ අභිලාෂයන් හා ගැටලු බහුල වීමෙන් සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ නොහැකි බවත් එම නිසා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මතු වූයේය යන්න පැහැදිලි විය යුතුය.
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දී ජනතාව පාලනයට සම්බන්ධ වන්නේ වක්‍රවය.එනම් නියෝජිතයන් මගිනි. මෙමගින් ජනතා හඬට සීමා පැනවෙන අතර ජනතාව වෙනුවෙන් තීන්දු ගැනීමේ වගකීම වෘත්තීය දේශපාලනඥයින් අත ආණ්ඩුව තබා ඇත.
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සීමිත හා වක්‍ර ස්වරූපය විස්තර විය යුතුය. එනම් සීමිත වන්නේ පාලන කටයුතු සම්බන්ධ මහජන සහභාගීත්වය වරින් වර පවත්වන මැතිවරණ ක්‍රියාවලියක් වෙත ලඝු කොට ඇති නිසයි. එය වක්‍ර වන්නේ ජනතා නියෝජිතයන් මගින් පාලන කටයුතු ක්‍රියාත්මක කරන නිසාය.
- ජනතාවට සෘජුවම බලය ක්‍රියාත්මක කළ හැක්කේ ජනමත විචාරණයකදී වැනි අවස්ථාවලදී පමණක් බව
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මැතිවරණය මත පදනම් වන බැවින් මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වේ.
- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ඵලදායී ලෙසින් පුරවැසි සහභාගීත්වය හා වගවීම් සහතික කිරීම සඳහා මැතිවරණ ක්‍රමය මගින් පහත සඳහන් නිර්ණායක ආරක්ෂා කළයුතු බව කෙටියෙන් පැහැදිලි විය යුතුය. අර්ථවත්භාවය, තරගකාරීත්වය, නිදහස, රහස්‍යභාවය, සාධාරණත්වය, නිතර මැතිවරණ පැවැත්වීම, සමානාත්මතාවය,
- මේ අනුව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සැළකිය හැක්කේ මහජන පරමාධිපත්‍යයේ අවම ස්වරූපය ලෙස බව විස්තර විය යුතුය.

10.

I. ජාතික බලය හා ජාතික අභිලාෂ

■ රජයක ජාතික අභිලාෂයන් මොනවාද යන්න පැහැදිලි කිරීම.

■ ජාතික අභිලාෂයන් යනු එක් එක් රටවල් සතු ජාතික බලයේ ප්‍රකාශනයකි. ජාතික බලයට සමානුපාතික ලෙස අභිලාෂයන් ඇරීම ලෝක දේශපාලනයේ යථාර්ථයකි.

■ ස්වකීය ජාතික අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට ආණ්ඩුවේ බොහෝ උපකරණ හෝ උපක්‍රම තිබේ.ඒ අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැදගත් වේ.

■ බොහෝ විට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වනු ලබන්නේ විදේශ ප්‍රතිපත්තිය හරහා ය.

■ වෙනත් මෙවලම් ලෙස

ප්‍රචාරණය, ආර්ථික උපාය මාර්ග,සන්ධාන ගතවීම් හා ගිවිසුම් ගතවීම භාවිතා කරයි.

■ ඇතැම් විට අභිලාෂයන් ජය ගැනීමට බලය භාවිතා කරයි.

II. පැසිස්ට්වාදය

- සම්භවය සහ පසුබිම කෙටියෙන් සඳහන් කළ යුතුය
- ෆැසිස්ට්වාදයේ ලක්ෂණ
  - දේශපාලන ඒකබලවාදය
  - රාජ්‍ය වන්දනය
  - නායක වන්දනය
  - පෞද්ගලික නිදහසක් නොමැති වීම
  - අත්‍යන්ත වර්ගවාදය/ ජාතිවාදය
  - අත්‍යන්ත රණවාදය
  - ප්‍රචණ්ඩත්වය සහ භීෂණය දේශපාලන බල මාධ්‍යයක් ලෙස භාවිතා කිරීම

III. ප්‍රතිපත්ති ක්‍රියාදාමය

■ එහි ක්‍රියාවලිය පිළිබඳ කෙටි හැඳින්වීම සහ පැහැදිලි කිරීම

■ වැඩිදුර පැහැදිලි කිරීම සඳහා ප්‍රතිපත්ති චක්‍රය අඳින්න.

IV. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අභියෝග

■ කෙටි හැඳින්වීම

■ බලපාන සාධක සඳහන් කළ යුතුය

■ අභියෝගවල මූලාශ්‍ර

- කුඩා රාජ්‍යයක් වීම
- ආර්ථික හා භෞතික ශක්තීන් අවම වීම
- කලාපීය බල තුලනය
- ජාත්‍යන්තර බල තුලනය
- අභ්‍යන්තර සමාජ දේශපාලනික දෘෂ්ටීන් හා කතිකාවත්

V. සමාජ සම්මුතිවාදය

■ කෙටි හැඳින්වීම

■ චින්තකයින් හා ඔවුන්ගේ අදහස්